**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කිය විය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරිනියන් දෙදෙනෙකුගේ පවරා නොගත් රු.128,700 ක ණය ශේෂයක්, සේවක ණය ගිණුමට ගලපා තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම |
| (ආ) | ගොඩනැගිලි වටිනාකම රු.45,195,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ දි නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.9,527,450 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ උපලේඛන හා වෙනත් ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය යටතේ උපලේඛන පිළියෙල කිරීමට ප්‍රමාද වූ බව දන්වමි. | ගිණුම් විෂයයන් සඳහා උපලේඛන නිවැරදිව පිළියෙල කර ගත යුතු වීම |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.42,543,078 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,451,639 ක් විය. වරිපනම් හා බදු, බලපත්‍ර ආදායම වැඩිවීම හා අලුත්වැඩියා හා නඩත්තු වියදම අඩුවීම මේ සඳහා හේතු වී තිබුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා අක්කර බදු<br>සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.4,777,727 ක වරිපනම් බදු හා රු.1,275,580 ක අක්කර බදු අය කර නොතිබුණි. | 2021 වර්ෂයේ හිඟ අය කිරීමට කටයුතු කරන බව දන්වමි. | සභාවට ලැබිය යුතු ආදායම් අය කළ යුතු වීම |
| (ආ) | කුලී<br>සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 88 කින් අය විය යුතු රු.1,122,152 ක කුලී අය කර ගැනීමට නඩු පවරා ඇතත්, අදාළ මුදල් අය කර නොතිබූ අතර, කඩ කාමර 69 ක් සඳහා නව තක්සේරු පදනම්ව ගිවිසුම්ගත වී නොතිබුණි. | නඩු පවරා ඇති අතර, ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ මුදල් අය කළ යුතු වීම |
| (ඇ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.369,302 ක් හා මුද්දර ගාස්තු රු.36,291,847 ක් අය කර නොතිබුණි. | උපලේඛන යවා ඇති අතර ඉදිරියේ දී ලැබීමට අපේක්ෂිත බව දන්වමි. | ලැබිය යුතු මුදල් අය කළ යුතු වීම |
| (ඈ) | වෙනත් ආදායම්<br>ත්‍රිරෝද රථ 506 ක් සඳහා අය විය යුතු රු.4,493,500 ක් හා සංදේශන කුළුණු 07 ක් සඳහා අය විය යුතු ගාස්තු ගණනය කර, අය කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන නීති උපදෙස් මත කටයුතු කරමි. | අය කළ යුතු ආදායම් ලබා ගත යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 05 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු.17,047,488 ක ලැබිය යුතු වරිපනම්, මුද්දර ගාස්තු හා ජල ගාස්තු අය කර නොතිබුණු අතර, වසර 01 සිට 05 දක්වා කාල පරාසයක් අය වීම හිඟ හිටව පවතින රු.291,038 ක කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි. | අය කිරීමට හා නිරවුල් කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු මුදල් අය කිරීම හා ගෙවීම් නිරවුල් කළ යුතු වීම |

### 3.2 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ දී සභාවට පවරා දී තිබූ වර්ග අඩි 6,928 ක් වූ තලාතුඔය බස් නැවතුම්පොල පිහිටි ස්ථානයේ පවතින ගොඩනැගිල්ල භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | අයිතිය සම්බන්ධ ගැටළුවක් පවතින අතර, එය විසඳා ගත් පසු බදු දීමට කටයුතු කරන බව දන්වමි. | වත්කම මඟින් නිවැරදිව ආදායම් අය කර ගත යුතු වීම |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිතුල්මුල්ල උඩ කොටස පාලම නැවත ඉදිකිරීම් කර්මාන්තය - රු.2,000,000 | | |
| | කර්මාන්තයට අදාල පාලමේ පාදම සඳහා භාවිතා කළ කොන්ක්‍රීට්වල සම්පීඩණ ශක්තිය (Compressive Strength) ගුණත්වයෙන් තොර බව අදාළ පරීක්ෂණ වාර්තා මඟින් තහවුරු වී තිබිය දී, 2021 පෙබරවාරි 24 වන දින කොන්ක්‍රීට් ඝණ මීටර් 18.37 ක් සඳහා රු.374,332 ක් ගෙවා තිබූ බැවින්, රු.2,000,000 ක වියදමින් ඉදිකළ පාළමේ ඉදිරි පැවැත්ම පිළිබඳ ගැටළු සහගත තත්වයක් පැවතුණි. | මෙම කර්මාන්තයේ වගකීම් කාලය වසරක් දක්වා කල් දැමීමට කටයුතු කළ බව දන්වමි. | නිවැරදි ප්‍රමිතියෙන් යුතුව ඉදිකිරීම් සිදු කළ යුතු වීම |
| (ආ) | මයිලපිටිය කඳුරට සැදැල්ල Lot 13 ඉඩම් කොටස වටා වැට ඉදිකිරීම් කර්මාන්තය - රු.798,616 | | |
| | ඇස්තමේන්තුව අනුව, පිරිවිතරවලට අනුකූල නොවන ලෙස ඉදිකළ දිග මී.154 ක වැට සඳහා රු.337,876 ක් ගෙවා තිබුණි. | මෙම වෙනස මත සිදු වූ මුලා වෙනස ගණනය කිරීමට කටයුතු කළ බව දන්වමි. | පිරිවිතර අනුව ඉදිකිරීම් සිදු කළ යුතු වීම |